## මුලටියන ප්‍රාදේශීය සභාව

මුලටියන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු පවතින තනතුරු වර්ග හා ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ :-

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමානය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු (III) ශ්‍රේණිය | 01 | රා.ප.ච. 03/2016 අනුව PL-3 – 2016 වැටුප් බාණ්ඩයේ ආරම්භක පියවර | I. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් ඕනෑම විෂයයන් හය (06)ක් සමත් විය යුතුය.<br>II. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.<br>III. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ (ආයතනයේ) පුරප්පාඩු රියදුරු තනතුරේ ප්‍රවාහන කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමට හැකිවන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ 4 මට්ටමේ) කුසලතා සහතිකයක් හා රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. |
| 02 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු (III) ශ්‍රේණිය | 02 | රා.ප.ච. 03/2016 අනුව PL-1 – 2016 වැටුප් බාණ්ඩයේ ආරම්භක පියවර | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම |
| 03 | සෞඛ්‍ය කම්කරු (III) ශ්‍රේණිය | 01 | රා.ප.ච. 03/2016 අනුව PL-1 – 2016 වැටුප් බාණ්ඩයේ ආරම්භක පියවර | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම |

01. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවකු හෝ මීට පෙර පළාත් පාලන ආයතනයක සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
v. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මේ නිවේදනය අවලංගු කිරීම මුලටියන ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.
vi. අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ අඛණ්ඩ වසර 5 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.
vii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

i. වැඩ/ ක්ෂේත්‍ර හා සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් දෙනු ලබන ලකුණු මත තෝරා ගන්නා අයදුම්කරුවන් බඳවා ගනු ලබන අතර,

ii. රියදුරු තනතුර සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ හා වෘත්තිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලකුණු මත අයදුම්කරු තෝරා ගනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

ii. වැන්දඹු හා අනත්දරු අරමුදලට දයකත්වය හිමි වේ.

iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර 03 අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයක සිටින සේවකයන්ට පමණක් ස්ථිර පත්වීම ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම වසර 03 ක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

iv. දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන කණිෂ්ඨ සේවක සේවයේ ප්‍රාථමික ශිල්පීය/ ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට අමතරව ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි වලටද, කොන්දේසි වලටද දකුණු පළාත් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින්වර පවරනු ලබන කොන්දේසි වලටද, පළාත් පාලන ආයතන වලට අදාළ අණපනත්/ පනත්වලට විධිවිධාන වලටද මුලටියන ප්‍රාදේශීය සභාව මගින් වරින්වර ගනු ලබන සභා සම්මුති වලටද අනුකූලව සේවය කිරීමට එකඟ විය යුතුය.

04. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

1. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදසියක තමන් විසින් සකස් කරගත් අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතුය.

2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලි වල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්
iii. අධ්‍යාපන සහතික
iv. වෘත්තිය හා වෙනත් සුදුසුකම්
v. පදිංචිය සහතික කිරීමේ සහතිකය
vi. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් ලබා ගත යුතුය)

3. සියලුම අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2018.06.01 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, ප්‍රාදේශීය සභාව, මුලටියන" යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු හා සහතික පත්‍ර අසත්‍ය බව හෝ සාවද්‍ය බව පෙනී ගිය හොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් සේවයේ යෙදී සිටින කවර අවස්ථාවකදී වුව ද සේවයෙන් පහකරනු ලැබීමට යටත් වනු ඇත.

එච්. එම්. සිරියලතා,
ලේකම්,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2018 අප්‍රේල් 18 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
මුලටියන.

මුලටියන ප්‍රාදේශීය සභාව

ආදර්ශ අයදුම් පත්‍රය

මුලටියන ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය හා ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණ තනතුරු සඳහා බඳවා ගැනීමේ අයදුම් පත්‍රය. (රියදුරු/ සෞඛ්‍ය කම්කරු/ වැඩ ක්ෂේත්‍ර කම්කරු)

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :-
2. මුලකුරු සමග නම :-
3. මුලකුරුවලින් හැඳින්වෙන නම :-
4. ස්ථිර ලිපිනය :-
5. ස්ත්‍රී/ පුරුෂ භාවය :-
6. උපන් දිනය :- අවුරුද්ද :- මාසය :- දිනය :-
7. 2018.06.01 දිනට වයස :- අවුරුදු :- මාස :- දින :-
8. ජාතික හැඳුනුම්පත් අංකය :-
9. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :-
10. විවාහක/ අවිවාහක බව :-
11. මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය :-
12. අධ්‍යාපන සුදුසුකම් :-
13. වෘත්තීය සුදුසුකම් :-
14. සේවා පළපුරුද්ද :-
15. වෙනත් විශේෂ කුසලතා :-

මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිඳු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දන්වමි.

........................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :-

05 - 441/1

---

## මුලටියන ප්‍රාදේශීය සභාව

### දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙක් සේවයේ යොදවා ගැනීම

මුලටියන ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. උපලේඛනය 01

| *අනු. අංකය* | *තනතුර* | *බඳවාගැනෙන සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය මාසික* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු | 02 | රු. 24,250-10 x 250-10 x 270 - 10 x 300-12 x 330- රු. 36,410 (PL1 – 2016) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි:*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ මීට පෙර පළාත් පාලන ආයතනයක සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
v. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මේ නිවේදනය අවලංගු කිරීම මුලටියන ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. දෛනික පදනම මත බඳවා ගැනේ.
ii. මෙය ස්ථිර පත්වීමක් ලබා ගැනීම සඳහා සුදුසුකමක් නොවේ.

04. *බඳවා ගැනීමේ ක්‍රමය:*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර ලකුණු ලබා දෙන ක්ෂේත්‍රයන් හා ලකුණු ප්‍රමාණයන් පහත දැක්වේ.

| *අනු. අංකය* | *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 2 | අමතර සුදුසුකම් | 10 |
| 3 | පළපුරුද්ද | 10 |
| 4 | සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 |
| 5 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 |

මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනේ.

05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

1. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක තමන් විසින් සකස් කරගත් අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතුය.

2. අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

   i. උප්පැන්න සහතිකය;
   ii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්;
   iii. අධ්‍යාපන සහතික;
   iv. පදිංචිය සහතික කිරීමේ සහතිකය ;
   v. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් ලබා ගත යුතුය.)

3. සියලුම අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2018.06.01 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, ප්‍රාදේශීය සභාව, මුලටියන" යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "සෞඛ්‍ය කම්කරු - දෛනික" ලෙස සඳහන් කළ යුතුය.

අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු හා සහතික පත්‍ර අසත්‍ය බව හෝ සාවද්‍ය බව පෙනී ගිය හොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් සේවයේ යෙදී සිටින කවර අවස්ථාවකදී වුව ද සේවයෙන් පහකරනු ලැබීමට යටත් වනු ඇත.

එච්. එම්. සිරියලතා,
ලේකම්,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2018 අප්‍රේල් 18 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
මුලටියන.

**මුලටියන ප්‍රාදේශීය සභාව**

ආදර්ශ අයදුම් පත්‍රය

***මුලටියන ප්‍රාදේශීය සභාවේ දෛනික වැටුප් ගෙවීමේ පදනම මත කණිෂ්ඨ සේවක සේවයේ ප්‍රාථමික සේවා ශ්‍රේණියේ සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම් පත්‍රය***

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :-
2. මුලකුරු සමග නම :-
3. මුලකුරුවලින් හැඳින්වෙන නම :-
4. ස්ථිර ලිපිනය :-
5. ස්ත්‍රී/ පුරුෂ භාවය :-
6. උපන් දිනය :- අවුරුද්ද :- මාසය :- දිනය :-
7. 2018.06.01 දිනට වයස :- අවුරුදු :- මාස :- දින :-
8. ජාතික හැඳුනුම්පත් අංකය :-
9. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :-
10. විවාහක/ අවිවාහක බව :-
11. මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය :-
12. අධ්‍යාපන සුදුසුකම් :-
13. වෙනත් විශේෂ කුසලතා :-

මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිඳු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දන්වමි.

........................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : —————— .

05 - 441/2